## කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

### වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

### ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ දැනට පුරප්පාඩුව පවත්නා "කළමනාකරණ සහකාර" - III ශ්‍රේණිය තාක්ෂණික නොවන තනතුරු 3 ක් සඳහා සුදුසුකම් හා පළපුරුද්ද ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **සුදුසුකම් හා පළපුරුද්ද :**

 1.1 බාහිර අයදුම්කරුවන් සඳහා :

 අධ්‍යාපන සුදුසුකම් :

 අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සිංහල භාෂාව/ දෙමළ භාෂාව හෝ සාහිත්‍ය සහ ගණිතය ඇතුළු විෂයයන් 04 කට සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06 කින් සමත් වී තිබීම. (එක් වරක දී අවම වශයෙන් විෂයයන් 05 කින් සමත් වී තිබිය යුතුය.);

 *හා*

 අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් විෂයයන් 03 කින් සමත් වී තිබීම.

 වෙනත් සුදුසුකම් :

 පරිගණක වදන් සැකසුම, යතුරු ලියනය හා ලඝු ලේඛනය පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම අතිරේක සුදුසුකම් වශයෙන් පිළිගැනේ.

 1.2 අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :

 ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය හා ශිල්පීය නොවන සේවා ගණයන් හි වසර 05 ක සේවා කාලය සම්පූර්ණ කර තිබීම;

 *හා*

 අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සිංහල භාෂාව/ දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 04කට සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06 කින් සමත්වී තිබීම. (එක් වරක දී අවම වශයෙන් විෂයයන් 05 කින් සමත් වී තිබිය යුතුය.).

2. **වයස :**
 අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 කට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපායි.

3. **වැටුප් පරිමාණය :**

 ඒ 1-1-2016 - රු. 27,910- 10 x 300 - 7 x 350 - 4 x 495 - 20 x 660 - රු. 48,540/=
 (කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව)

4. **බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

 පත්වීම් බලධාරියා විසින් නියම කරනු ලබන මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් අතුරින් ආයතනයේ බඳවාගැනීම් පටිපාටියට අනුව තෝරා ගැනීම් සිදු කෙරේ.

 තනතුර ස්ථිර වන අතර, රජයේ අනුමත ප්‍රතිශතයන්ට අනුව සේවක අර්ථසාධක අරමුදලට හා සේවාදායකයන්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිත වේ. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ. 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ සහ 2011 අංක 05 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ සංශෝධිත පනතේ විධිවිධානවලට රජය විසින් වරින් වර පනවනු ලබන නීති රීති රෙගුලාසිවලට ද යටත් විය යුතුය.

ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව ම සකස් කරන ලද අයදුම්පත්‍රයක් මගින් අයදුම් කළයුතු වේ. බාහිර අයදුම්කරුවන් සෘජුවම ද, රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ද තම අයදුම්පත් යොමු කළ යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2024.02.05** දින හෝ එදිනට පෙර අධ්‍යක්ෂ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය, දෙවන මහල, ඩී කොටස, සෙත්සිරිපාය දෙවන අදියර, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''**ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ කළමනාකරණ සහකාර තනතුරට බඳවා ගැනීම**'' යනුවෙන් සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අපහැදිලි, තැපෑලෙන් අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර පිළිබඳව ආයතනය විසින් වගකියනු නොලැබේ.

කේ. ජී. ලැනරෝල්,
අධ්‍යක්ෂ.

2024 ජනවාරි මස 09 වැනි දින,
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
දෙවන මහල, ඩී කොටස, සෙත්සිරිපාය දෙවන අදියර, බත්තරමුල්ල.